විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

මාධ්‍ය නිවේදනය

සාගර විද්‍යා හා පරිසරය පිළිබඳ අයෝරා විශිෂ්ටතා මධ්‍යස්ථානය විවෘත කරමින් ශ්‍රී ලංකාව 2026 අයෝරා දිනය සමරයි.

සාගර විද්‍යා හා පරිසරය පිළිබඳ අයෝරා විශිෂ්ටතා මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කරමින් ශ්‍රී ලංකාව, 2026 මාර්තු 11 වැනි දින අයෝරා දිනය සැමරීය. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ විශිෂ්ටතා මධ්‍යස්ථානයේ සත්කාරකත්වය දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද මෙම දෙමුහුන් උත්සවයට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මහතා සහභාගී විය.

සාගර පාලනයේ කලාපීය සහයෝගීතාව ශක්තිමත් කිරීම සහ පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (අයෝරා) මූලධර්ම කෙරෙහි ශ්‍රී ලංකාව දක්වන අඛණ්ඩ කැපවීම මෙම සැමරුම මගින් අවධාරණය කෙරිණි. ඉන්දියානු සාගර කලාපය පුරා සිටින ප්‍රජාවන්ගේ යහපැවැත්ම සහ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමේදී කලාපීය සහයෝගීතාවේ ප්‍රත්‍යක්ෂ ප්‍රතිලාභ අවධාරණය කරමින් 'අයෝරා ජීවන තත්ත්වය නංවාලයි' යන 2026 වසරේ අයෝරා දින තේමාව මෙම උත්සවයේදී ඉස්මතු විය.

ඉන්දියානු සාගර කලාපය තුළ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමේ වැදගත්කම සහ සාගරය මත පදනම් වූ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකාව සතු කාර්යභාරය නියෝජ්‍ය අමාත්‍යවරයා සිය අදහස් දැක්වීමේදී ඉස්මතු කළේය. නව මුලපිරීමේ වැදගත්කම ඉස්මතු කරමින් අමාත්‍යවරයා ප්‍රකාශ කළේ සාගර විද්‍යා හා පරිසරය පිළිබඳ ශ්‍රී ලංකාවේ අයෝරා විශිෂ්ටතා මධ්‍යස්ථානය, ඉන්දියානු සාගර කලාපය පුරා විද්‍යාව පාදක සාගර පාලනයට සහය වීම සඳහා පර්යේෂණ, දැනුම හුවමාරුව සහ ශක්‍යතා සංවර්ධනය සඳහා මධ්‍යස්ථානයක් ලෙස සේවය කරනු ඇති බවයි.

ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ මහලේකම් ගරු සංජීව රන්ජන් මහතාගේ පණිවිඩය මාර්ගගත ආකාරයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම උත්සවය අතරතුර, ශ්‍රී ලංකාව විසින් සාගර විද්‍යා සහ පරිසරය පිළිබඳ ශ්‍රී ලංකාවේ අයෝරා විශිෂ්ටතා මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කරන ලද අතර එය කලාපීය විද්‍යාත්මක සහයෝගීතාව සහ දැනුම හුවමාරුව ශක්තිමත් කිරීමෙහිලා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම විවෘත කිරීමට සමගාමීව ඉන්දියානු සාගර කලාපය පුරා ප්‍රධාන සාගර හා පාරිසරික ගැටලු පිළිබඳ සංවාදය ඉදිරියට ගෙන යෑම අරමුණු කරගත් වෙබ් සම්මන්ත්‍රණ මාලාවක්ද ආරම්භ කරන ලදී. සමාරම්භක වෙබ් සම්මන්ත්‍රණ වැඩසටහනේ ප්‍රධාන දේශනය බටහිර ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයේ මහාචාර්ය චරිත පට්ටිආරච්චි විසින් පවත්වන ලද අතර ඉන් පසුව අන්තර්ක්‍රියාකාරී ප්‍රශ්නෝත්තර සැසියක් පැවැත්විණි.

අයෝරා සාමාජික රටවල දූත මණ්ඩල ප්‍රධානීහු, සංවාද හවුල්කරුවන්ගේ දූත මණ්ඩල ප්‍රධානීහු, නිරීක්ෂක රටවල සහ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාර්ශවකරුවෝ ඇතුළු විශාල පිරිසක් භෞතිකව සහ මාර්ගගතව මෙම වැඩසටහනට එක්වූහ.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ
2026 මාර්තු 11 වැනි දින

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk